# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## විල්ගමුව ප්‍රාදේශීය සභාව

රියදුරු තනතුරේ පුරප්පාඩු පිරවීම

1. විල්ගමුව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවත්නා පහත සඳහන් තනතුර සඳහා බඳවා ගැනීමට විල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. පුරප්පාඩු පවතින තනතුරු :

| *අනු. අංකය* | *තනතුරු* | *පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* |
|---|---|---|---|
| 01 | රියදුරු | 01 | දෛනික වැටුප් ගෙවීමේ පදනම මත |

**3. උක්ත තනතුරු සඳහා අවශ්‍ය පොදු සුදුසුකම් :**

1.1. අධ්‍යාපන සුදුසුකම්- අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙන් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම, මින් විෂයන් 05 ක් එක් වසරකදී සමත් වී තිබිය යුතුයි.

1.2. කායික සුදුසුකම් - සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් හා ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර බල ප්‍රදේශයේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

1.3. වෙනත් :

i. අයදුම්කරු අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ වසර 03 කට නොඅඩු ස්ථිර පදිංචි අයෙකු විය යුතුය.

ii. ශ්‍රීලංකාවේ පුරවැසියෙකු විය යුතු අතර විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

iii. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් - එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

iv. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18- 45ත් අතර විය යුතුය. ( අදාළ පළාත් පාලන ආයතනයේ සේවයේ යෙදී සිටින අය සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලපානු නොලැබේ)

**රියදුරු තනතුර සඳහා අවශ්‍ය විශේෂ සුදුසුකම්**

v. රියදුරු සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රය - ( D කාණ්ඩයේ රියදුරු බලපත්‍රයක් විය යුතුය.

vi. එය අවුරුදු 03 කට පෙර ලබාගත් එකක් විය යුතුය.

vii. ප්‍රායෝගික පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

viii. පෙර සේවය කර ඇත්නම් එම ආයතන මගින් ලබාගත් සහතික

**සටහන -** පුරප්පාඩු සම්පූර්ණ කිරීම පිණිස පළමුව අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ අයදුම්කරුවන් අතරින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

**බඳවා ගැනීමේ ක්‍රමය:**

3.1. බඳවා ගන්නා ප්‍රතිශතය :

| *ධාරාව* | *ප්‍රතිශතය* |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | අදාළ නොවේ |
| කුසලතා | අදාළ නොවේ |

3.2. බඳවා ගැනීමේ ක්‍රමය .- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබාගන්නා ලකුණු අනුපිළිවෙලට අනුව පවතින පුරප්පාඩු වලට පත් කරනු ලැබේ.

3.3. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය .- සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලැබේ.

| ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය (100%) | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අධ්‍යාපන සුදුසුකම් | 25 | අදාළ නොවේ. ඉහළම ලකුණු ලබාගත් ඉල්ලුම්කරුවන් පුරප්පාඩු අනුව තෝරාගනු ලැබේ. |
| පළපුරුද්ද | 70 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 05 | |
| මුළු ලකුණුවල එකතුව | 100 | |

(පුරප්පාඩු තනතුර සඳහා බඳවා ගැනීමේ දී අදාළ පළාත් පාලන ආයතනයේ දැනට සේවයේ නියුතු අය සම්බන්ධයෙන් ප්‍රමුඛතාවයක් දිය හැක)

**4. වෙනත් පොදු සුදුසුකම්:**

4.1. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබුවකු නොවිය යුතුය.

4.2. රජයේ/ පළාත් පාලන/ සංස්ථා සේවයෙන් පහ කරනු ලැබුවෙක් හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබුවකු නොවිය යුතුය.

**5. ආයදුම්පත් ඉදිරිපත් කිරීම:**

5.1. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙළ කර ගන්නා ලද අයදුම් පත් 2026.08.10 වැනි දිනට පෙර " ලේකම්, ප්‍රාදේශීය සභාව, විල්ගමුව" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

5.2. අයදුම්පත් බහාලනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම් පත හා අඩුපාඩු සහිත හෝ මෙම දැන්වීමේ සුදුසුකම් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී නැතිවන අයදුම්පත් පිළිබඳව ප්‍රාදේශීය සභාව වගකියනු නොලැබේ.

5.3. අයදුම් පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කිරීම සාමදාන විනිශ්චකාරවරයෙකු/ ග්‍රාම නිලධාරියකු/ මාණ්ඩලික නිලධාරියකු විසින් සහතික කළ යුතුය.

5.4. අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල සහතික කළ ඡායා පිටපත් අමුණා එවිය යුතුය.

- උප්පැන්න සහතිකය
- අධ්‍යාපන සහතිකය
- ජාතික හැඳුනුම්පත
- පදිංචිය සනාථ කිරීම පිණිස ග්‍රාම නිලධාරී සහතිකය
- මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක් (ඉන් 01ක් ග්‍රාම නිලධාරිගෙන් විය යුතුය)
- වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කරන සහතික
- සේවා සහතිකය

5.5. අයදුම් පත්‍රය සමග ඉදිරිපත් කරන සහතික වල මුල් පිටපත් පරීක්ෂණ අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතුවේ.

**සැලකිය යුතුයි :**

දැනට රාජ්‍ය සේවයේ නියුතු වූවන් තමන්ගේ අයදුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශ මත එවිය යුතුය.

ආර්. ඩබ්. ඩබ් .සුදර්ශනී,
ලේකම්,
විල්ගමුව ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 28 වැනි දින,
විල්ගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේදීය.